## නියම හා කොන්දේසි - පරම හිමිකාරිත්වය සහ හවුල් ව්‍යාපාරය

**ලියාපදිංචි අංක PQ27 දරන** නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය ("NDB බැංකුව") විසින් නිශ්චිතව දක්වනු ලබන තාක්දුරට හැර, පරම හිමිකාරත්වය විසින් හෝ හවුල් ව්‍යාපාරය විසින් හෝ පරම හිමිකාරත්වයේ හෝ හවුල් ව්‍යාපාරයේ නමින් (ව්‍යාපාරය, ආස්ථිත්වය හෝ ගිණුම්හිමියා) මෙහි මින්මතු ඕනෑම ස්වාභාවයකින් විවෘත කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන එක් එක් සහ සෑම ගිණුමක් (ගිණුම්) සඳහාම මෙම නියම හා කොන්දේසි ("නියම හා කොන්දේසි") අදාළ වන්නේ ය. (මෙම ලේඛනයේ ඒකවචන යෙදුම් සඳහා බහුවචනද බහුවචන යෙදුම් සඳහා ඒක වචනද, පුරුෂ ලිංග අර්ථයන් සහිත වචන සඳහා ස්ත්‍රී ලිංග අර්ථයන් ද, ඇතුළත් වේ).

1. NDB බැංකුවේ පවත්වාගෙන යනු ලබන සියලු ගිණුම්,-

   (අ) කලින්කල NDB විසින් නිශ්චිතව දක්වනු ලබන මාර්ගෝපදේශ සහ නියම හා කෝන්දේසි මගින් පාලනය විය යුතු බවට;

   (ආ) ශ්‍රී ලංකා මහබැංකුව (CBSL) විසින් පනවනු ලබන රීති සහ නියෝග මගින්, විදේශීය විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් හෝ වෙනත් යම් අධිකාරියක් විසින් කලින්කල නිකුත්කරනු ලබන විධාන මගින් සහ ශ්‍රී ලංකාවේ තත්කාලයේ බලපවත්නා නීති මගින් පාලනය විය යුතු බවට,

   ගිණුම්හිමියා විසින් මෙයින් පිළිගෙන එකඟව සිටිනු ලැබේ.

2. මෙම නියම හා කොන්දේසි අතර සහ/හෝ ඉහත (අ) හෝ (ආ) ඡේදවල අන්තර්ගත විධිවිධාන අතර යම් අනනුකූලතාවක් පැවතියහොත් පසුව සඳහන් (1ආ) ඡේදයේ අන්තර්ගත විධිවිධාන වඩාත් ප්‍රමුඛ ලෙස බලාත්මක විය යුතු ය.

3. ව්‍යාපාරයේ හෝ ආස්ථිත්වයේ සැකැස්ම පෙන්නුම් කරනු ලබන ව්‍යාපාරයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහ/හෝ වෙනත් ලේඛනවල පිටපතක් සහ බැංකුව විසින් කලින්කල ඉල්ලා සිටිනු ලැබිය හැකි ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යෑම සඳහා එම ව්‍යාපාරය හෝ ආස්ථිත්වය වෙත ලබා දී ඇති සියලු වර්තමාන බලපත්‍ර, අනුමතයන් සහ කැමැත්ත ප්‍රදානය කිරීම්වල පිටපත් ගිණුම්හිමියා විසින් වහාම බැංකුව වෙත සපයනු ලැබිය යුතු ය.

4. ගිණුම (ගිණුම්) මෙහෙයවීම සඳහා ගිණුම්හිමියා විසින් බලයලත් අත්සන්කරුවකු (අත්සන්කරුවන්) පත්කරනු ලැබිය යුතු මෙන්ම ගිණුම්හිමියා වෙනුවෙන් (චෙක්පත්, හරකිරීම් නියෝග යනාදිය) අත්සන් කිරීම සඳහා NDB බැංකු වෙත එම බලයලත් තැනැත්තාගේ (තැනැත්තන්ගේ) ආදර්ශක අත්සන (අත්සන්) සැපයීම සඳහා ගිණුම්හිමියා වගකීමෙන් බැඳී සිටිය යුතු වේ. සියලු අවශ්‍ය ලිපි ලේඛනද සමගින් ව්‍යාපාරය, ආස්ථිත්වය හෝ ගිණුම්හිමියා විසින් එක් එක් ගිණුම සඳහා අවශ්‍ය මැන්ඩේට්පත්‍රය, සහ අදාළ ගිණුම් විවෘත කිරීමේ ආකෘතිපත්‍ර (මැන්ඩේට් පත්‍රය) භාරදීමෙන් පසුව, ගිණුම්හිමියා විසින් විවෘත කරන ලෙස ඉල්ලා සිටිනු ලබන ගිණුම (ගිණුම්) බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි විවෘත කරනු ලැබිය හැකි ය.

5. මැන්ඩේට්පත්‍රයේ ලබාදී ඇති මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව ලියා අත්සන්කර ඇති හෝ ප්‍රතිග්‍රහනය කරන ලද අත්සන්කල උපදෙස් හෝ ලේඛන මත ක්‍රියාකිරීම සඳහා ගිණුම්හිමියා විසින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. පරම හිමිකාරත්ව ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී මෙහෙයුම් උපදෙස්වල යම් වෙනස්කිරීම් හෝ අහෝසිකිරීම් පරම වශයෙන් ලබාදිය යුතු බවටත් හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී එම වෙනස්කිරීම් හෝ අහෝසිකිරීම් හවුල් ව්‍යාපාරයේ සියලු කොටස් හිමියන් විසින් ඒකාබද්ධව ලබාදිය යුතු බවටත් ගිණුම්හිමියා විසින් එකගව සිටිනු ලැබේ. මෙම වගන්තියේ සඳහන් පරිදි ආදර්ශක අත්සන් සැපයීම ගිණුම්හිමියා පැහැර හැරීම හේතුවෙන් හෝ වැරදි සහගත ලෙස හෝ සම්පූර්ණ නොවන ලෙස එම ආදර්ශක අත්සන් සැපයීම හේතුවෙන් ගිණුම්හිමියා විසින් දරනු ලබන කිසිදු අලාභ හෝ පාඩු සම්බන්ධයෙන් NDB ආයතනය වගකියනු නොලැබේ. ගිණුම (ගිණුම්) වසා දැමීම සඳහා වූ උපදෙස් ඇතුලුව ගිණුම (ගිණුම්) සම්බන්ධයෙන් වූ වෙනත් උපදෙස් පිළිගැනීම මැන්ඩේට්පත්‍රයේ සඳහන් මෙහෙයුම් උපදෙස් නොසලකා හරිමින් සියලු පාර්ශව විසින් සිදුකල යුතු වේ. (මෙහෙයුම් උපදෙස්).

6. **NDB** ආයතනය සමග ඇතිකරගත් විශේෂ වැඩපිළිවෙල මගින් මිස, ගිණුම්හිමියා විසින් ස්වකීය ගිණුමෙන් (ගිණුම්වලින්) සීමාව ඉක්මවා මුදල් ආපසු ලබා නොගත යුතු වේ. ගිණුමේ (ගිණුම්වල) අරමුදල් ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී චෙක්පත් අගරුකිරීම සඳහා සහ එසේ ගෙවීම් නොකර ආපසු හරවා යවනු ලැබූ එක් එක් චෙක්පත් සඳහා ගාස්තු අයකිරීම සඳහා NDB බැංකුවට අයිතියක් ඇත්තේ ය. NDB බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි ගිණුමෙන් සීමාව ඉක්මවා මුදල් ආපසු ලබාගැනීම මගින් චෙක්පත් පිලිගැනීම කළ හැකි වේ. එවැනි අවස්ථාවලදී, ගිණුම්හිමියාගෙන් පොළිය සහ බැංකු ගාස්තු අයකිරීමේ අයිතිය NDB බැංකුව සතුවන අතර ඉල්ලා සිටීමේ දී කොන්දේසි විරහිතව පොළිය සහ බැංකු ගාස්තු ද සමග එම සීමාව ඉක්මවා වැඩිපුර ලබාගත් මුදල් ආපසු ගෙවීම සඳහා ගිණුම්හිමියා වගකීමෙන් බැඳී සිටියි. මෙය කිසිදු ආකාරයකින් අයිරා පහසුකමක් ප්‍රදානය කිරීම සඳහා NDB බැංකුව බැඳී සිටින බවට වූ කිසිදු ප්‍රකාශිත හෝ ව්‍යංගිත ගිවිසුමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

7. යම් අයිරාවක් හෝ ඒ හා සම්බන්ධ වෙනත් බැංකු පහසුකමක් ක්‍රියාත්මකව පවතින අතරතුරදී ඉහතකී ගිණුමට (ගිණුම්වලට) බැරකරනු ලබන යම් සහ සියලු මුදල්, එම අයිරාව හෝ වෙනත් බැංකු පහසුකම මත අයවිය යුතු පොළිය සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් එම පොළිය අඩුකිරීම සඳහා පළමුව අදාලකර ගනු ලැබිය යුතු ය. එවිට සහ ඉන්පසුව පමණක් එසේ බැරකරනු ලබන මුදල් එම අයිරාවේ හෝ වෙනත් බැංකු පහසුකමේ මූලික මුදල අඩුකිරීම සඳහා අදාළ කරගනු ලැබිය යුතු ය.

8. ජංගම ගිණුම් සම්බන්ධයෙන් උපචිත වන අයිරා මත සහ වෙනත් පහසුකම් මත වූ පොළිය දෛනික ශේෂය මත ගණනය කර මාසිකව හෝ තත්කාලීන ප්‍රධාන කාරණා අන්තර්ගත බැංකු වෙබ් අඩවියේ ප්‍රදර්ශනය වන ලේඛනයේ සඳහන් ආකාරයට හරකරනු ලැබේ. ජංගම ගිණුම්වල පවතින යම් බැරකම් ශේෂයන් මත පොළිය ගෙවනු නොලැබේ.

9. පොලී අනුපාතිකයේ (පොලී අනුපාතිකවල) සිදුවන වෙනස්කම් පිළිබඳ ලිඛිත නිවේදන හෝ වෙනත් යම් නිවේදන දේශීය පුවත්පත්වල ඇතුළත් කරනු ලබන නිවේදනයක් මගින් සහ/හෝ බැංකු පරිශ්‍රයේ සහ/හෝ බැංකු වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම මගින් සහ/හෝ බැංකු ප්‍රකාශයක් හරහා ලබාදිය යුතු අතර එසේ ලබාදෙන නිවේදන යථාපරිදි සහ ප්‍රමාණවත් ලෙස ලබාදුන් නිවේදනයක් ලෙස සලකනු ලැබිය යුතු මෙන්ම එම නිවේදන මගින් ගිණුම්හිමියා බැඳී සිටිය යුතු වේ.

10. බැංකුවේ වෙබ් අඩවියේ පළකිරීමෙන් පසුව ගිණුම සම්බන්ධයෙන් හෝ ගිණුම්හිමියා වෙත සපයන ලද වෙනත් බැංකු පහසුකම් සම්බන්ධයෙන් වූ සියලු සම්ප්‍රදායික බැංකු ගාස්තු සහ වෙනත් ගාස්තු මෙන්ම වියදම් අයකිරීම හෝ පැනවීම සඳහා සහ බැංකුවේ සාමාන්‍ය බැංකු කාර්ය පටිපාටිය ප්‍රකාරව අදාළ ගිණුමෙන් (ගිණුම්වලින්) මුදල් හරකිරීම සඳහා බංකුවට නිතරම හිමිකම් පැවතිය යුතුය. යම් හෝ සියලු ගිණුමක්(ගිණුම්) අවසන්කිරීමෙන්/වසාදැමීමෙන් පසුව එම අයකිරීම් ආපසු නොගෙවන බවට ගිණුම්හිමියා එකඟව සිටියි.

11. ඕනෑම කරුණක් සම්බන්ධයෙන් NDB බැංකුව කෙරෙහි වූ ගිණුම්හිමියාගේ වගකීම් සපුරාලීමට ගිණුම්හිමියා අපොහොසත්වන අවස්ථාවකදී, NDB බැංකුව සතුවන ඇස්කීසි කිරීමේ අයිතිවාසිකම්වලට අතිරේකව, කිසිදු පූර්ව නිවේදනයක් ලබාදීමෙන් හෝ පූර්වයෙන් කැඳවීම් නිකුත්කිරීමෙන් තොරව බැංකුව විසින් උචිත බවට තීරණය කරන කාලයකදී සහ ආකාරයට ඇපකරය සම්පූර්ණයෙන් ම නිශ්කාශනය කිරීමට හෝ එහි කොටසක් නිශ්කාශනය කිරීමට සහ පොළිය සහ වියදම් ඇතුලු මුදල් ගෙවා නිරාකරණය කිරීමේ අවස්ථාව දක්වා NDB බැංකුව වෙත අයවිය යුතු සියලු හිඟ මුදල්, එම ඇප ප්‍රතිශ්ඨා මුදලින් ප්‍රතිපූරණය කිරීම සඳහා NDB බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ.

12. නීතිය ක්‍රියාත්මකවීම මගින් හෝ අන්‍යාකාරයකින් NDB බැංකුවට හිමිකම් ලැබෙන සාමාන්‍ය හිලව්කිරීමේ හෝ වෙනත් අයිතිවාසිකම් හෝ ප්‍රතිකර්මවලට අමතරව, NDB බැංකුව විසින් ඕනෑම අවස්ථාවකදී ගිණුම්හිමියා වෙත නිවේදනය කිරීමෙන් තොරව ගිණුම්හිමියාගේ සියලු හෝ යම් ගිණුමක් (ගිණුම්) ගිණුම්හිමියා විසින් NDB බැංකුව සමග සැබෑ හෝ අවිනිශ්චිත මූලික හෝ සම්පාර්ශවීය හෝ වෙන් වෙන් වශයෙන් හෝ ඒකාබද්ධ වශයෙන් පවතින ඕනෑම වගකීම් සමග එක් කිරීම සහ/හෝ ඒකාබද්ධ කිරීම මෙන්ම ඉහත කී එවැනි යම් ගිණුමක (ගිණුම්වල) බැරට පවතින මුදල් හිලව්කිරීම හෝ පැවරීම කරනු ලැබිය හැකි ය.

13. බැර සටහන්වලට එරෙහිව ගිණුම්හිමියාගෙන් හෝ ගිණුම්හිමියා වෙනුවෙන් බැංකුව වෙත ප්‍රතිවටිනාකමක් ලැබීමට පවතීනම්, එම ප්‍රතිවටිනාකම නිසි පරිදි සහ නිසිකලට ලැබිය යුතු බවට වූ විධිවිධානය සහිතව NDB බැංකුව විසින් බැර සටහන් බලාත්මක කරනු ලැබේ. එසේ එම ප්‍රතිවටිනාකම් නොලැබුනහොත්, දැනුම්දීමකින් පවා තොරව එම බැර සටහන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ඉවත්කර ගැනීම සඳහා NDB බැංකුව වෙත හිමිකමක් ඇත්තේ ය.

14. ගිණුම්හිමියා විසින් ඉල්ලා සිටිනු ලබන යම් කාල පරාසයක් තුළ දී බැංකුව විසින් ගිණුම් ප්‍රකාශයක් (ගිණුම් ප්‍රකාශ) යවනු ලැබිය හැකි බවට ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි. එවැනි උපදෙස් නොමැති අවස්ථාවකදී, බැංකුවේ සාමාන්‍ය බැංකුකරණ කාර්යපටිපාටි ප්‍රකාරව ගිණුම සම්බන්ධයෙන් බැංකුව විසින් නිශ්චය කරනු ලබන යම් කාල පරාසයක් තුළ දී බැංකුව විසින් ගිණුම් ප්‍රකාශ යවනු ලැබිය යුතු ය. එම ගිණුම් ප්‍රකාශ සම්බන්ධ සියලු සටහන් වහාම පරීක්ෂාකිරීම සම්බන්ධයෙන් ගිණුම්හිමියා පරම වශයෙන් වගකියනු ලැබිය යුතු බවත් එම ගිණුම් ප්‍රකාශ සහ ගිණුම්හිමියා සතුව පවතින වාර්තා අතර යම් විෂමතාවක් පවතින බවට ගිණුම්හිමියා විසින් විශ්වාස කරන්නේ නම්, එම අදාළ ගිණුම් ප්‍රකාශයේ දි සිට දින හතක් (7) ඇතුළත ගිණුම්හිමියා විසින් බැංකුව වෙත ඒ පිළිබඳව ලිඛිත නිවේදනයක් ලබාදිය යුතු බවටත් ගිණුම්හිමියා විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ. ගිණුම්හිමියාගෙන් එවැනි නිවේදනයක් නොමැති අවස්ථාවක දී, අදාළ ගිණුම් ප්‍රකාශයේ (ගිණුම් ප්‍රකාශවල) නිවැරදිභාවය (සියලු කාර්ය සඳහා) ගිණුම්හිමියා විසින් පරම වශයෙන් පිළිගෙන සහතික කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. ඉහත කී කරුණුවලට අගති විරහිතව සහ මේ සම්බන්ධයෙන් බැංකුව මත කිසිදු වගකීමක් පැවරීමෙන් තොරව, එම ගිණුමේ ප්‍රකාශය (ගිණුම් ප්‍රකාශ) සම්බන්ධයෙන් බැංකුව විසින් පසුව යම් වරදක් අනාවරණය කරගනු ලැබුවහොත්, එම වරද බැංකුව විසින් අනාවරණය කරගත් වහාම යම් ගිණුමක් (ගිණුම්) හරකිරීම හෝ බැරකිරීම මගින් (උචිත ආකාරයට) එම වරද නිවැරදි කරනු ලැබිය හැකි බවට ගිණුම්හිමියා විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

15. NDB බැංකුව සම්බන්ධයෙන් ගිණුම්හිමියා විසින් ලියා අත්සන් කරනු ලබන චෙක්පත් පහත දැක්වෙන නියෝග මගින් පාලනය වන්නේ ය; එනම්

(අ) NDB බැංකුව විසින් නිකුත් කරනු ලබන චෙක්පොත ගිණුම්හිමියා විසින් සුරක්ෂිතව ස්වකීය භාරයේ තබාගත යුතු වේ. චෙක්පොත හෝ චෙක් පත්‍රිකා නැතිවී හෝ සොරමකට ලක්වී ඇති අවස්ථාවක දී, ඒ පිළිබඳව වහාම බැංකුව වෙත ලිඛිතව දැනුම්දීම සඳහා ගිණුම්හිමියා වගකීමෙන් බැඳී සිටියි. ඉහත කී නිවේදනය පූර්වයෙන් ලැබීමෙන් තොරව නැතිවී ඇති, සොරකමට ලක් වී ඇති, නීතිවිරෝධී ලෙස භාවිත කර ඇති, වංචාසහගත ලෙස වෙනස්කර ඇති හෝ කූට ලෙස සකස්කර ඇති චෙක්පතක් සඳහා NDB බැංකුව විසින් ගෙවීම් සිදුකර ඇති අවස්ථාවක දී, එසේ ගෙවන ලද මුදල ගිණුම්හිමියාගෙන් හරකර ගැනීම සඳහා NDB බැංකුවට හිමිකමක් ඇත්තේ ය.

(ආ) චෙක් පත්‍රිකා නැතිවී, සොරකමකට ලක් වී හෝ අස්ථානගතවී ඇති අවස්ථාවකදී, ගිණුම්හිමියා විසින් චෙක්පත් අංකය, දිනය, මුදල සහ ආදායකයාගේ නම සඳහන් කරමින් ගෙවීම් නතර කරන ලෙස NDB බැංකුව වෙත වහාම ලිඛිතව උපදෙස් ලබාදිය යුතු වේ. එම උපදෙස් ලැබෙන අවස්ථාව තෙක් අදාළ චෙක්පත (චෙක්පත්) සඳහා ගෙවීම් සිදුකර නැත්නම් පමණක්, එවැනි සියලු උපදෙස් බලාත්මක වන්නේය. දුරකථනයෙන් ලබාදෙන ගෙවීම් නතර කිරීමේ උපදෙස් එදිනට ලිඛිතව තහවුරු කළ යුතු වේ. එම දිනයේදීම එකී ලිඛිත උපදෙස් ලැබී නොමැති අවස්ථාවකදී, ගෙවීම් නතරකිරීමේ උපදෙස් අවලංගුකිරීම සඳහා NDB බැංකුවට අයිතියක් ඇත්තේ ය.

(ඇ) ගිණුමේ පවතින නිශ්කාශනය වූ අරමුදල් සම්බන්ධයෙන් චෙක්පත් නිකුත්කිරීම සඳහා ගිණුම්හිමියා විසින් වගකීම් භාරගත යුතු වේ.

16. සියලු පොළී මුදල්, කොමිස් මුදල් හෝ වෙනත් බැංකු ගාස්තු සහ වියදම් (නෛතික ගාස්තුද ඇතුලුව) සහ ගිණුම (ගිණුම්) සම්බන්ධයෙන් NDB බැංකුව මත පනවනු ලබන රජයේ බදු, වෙනත් බදු, ගාස්තු හෝ පැනවීම් සපුරාලීම සඳහා NDB බැංකුවෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි වෙනත් එවැනි මුදල් NDB බැංකුව විසින් ගිණුම්හිමියාගේ ගිණුමෙන් (ගිණුම්වලින්) හරකරනු ලැබිය හැකිය. එයට අමතරව NDB බැංකුව විසින් දරනු ලබන සියලු වියදම්, එනම් ගිණුමට අදාල තැපැල් ගාස්තු, මුද්දර ගාස්තු, දුරකථන ගාස්තු ගිණුම්හිමියාගෙන් අයකරනු ලැබේ.

17. ගිණුම්හිමියාගේ අවසන්වරට වාර්තා වී ඇති ලිපිනය වෙත දින දාහතරක (14) ලිඛිත නිවේදනයක් ලබාදීමෙන් පසුව තත්කාර්ය සඳහා හේතු දැක්වීමක් සහිතව හෝ එසේ හේතු දැක්වීමෙන් තොරව ඕනෑම අවස්ථාවක දී ස්වකීය පරම සහ බාධා විරහිත අභිමතය පරිදි NDB බැංකුව විසින් යම් ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ/හෝ යම් ගිණුමක් වසා දැමීම සහ/හෝ යම් සේවා අවසන්කිරීම කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී, ඉල්ලා සිටීමේ දී ගිණුම්හිමියාගේ සන්තකයේ පවතින සියලු භාවිත නොකල චෙක්පත් ගිණුම්හිමියා විසින් බැංකුව වෙත ආපසු භාරදිය යුතු වේ.

(අ) මාස විසිහතර (24) කාලසීමාවක් තිස්සේ අක්‍රීයව පවතින සහ/හෝ (බැංකුවේ වෙබ් අඩවියේ පළකරනු ලබන්නා වූ ද බැංකුව විසින් කලින් කල තීරණය කරනු ලබන්නාවූද) අවම ශේෂය පවත්වාගෙන නොයන ගිණුමක් (ගිණුම්) ගිණුම්හිමියාගේ අවසන්වරට වාර්තාගත වී ඇති ලිපිනය වෙත ගිණුම (ගිණුම්) වසා දැමීමේ වැඩකරන දින දාහතරක (14) ලිඛිත නිවේදනයක් ලබාදීමෙන් පසුව වසාදැමීමේ අයිතියද බැංකුවේ අභිමතය පරිදි බැංකුව වෙත රඳවා තබා ගනු ලැබේ. එවැනි අවස්ථාවලදී, ගාස්තු අයකිරීම සඳහා හෝ කොමිස් මුදලක් වශයෙන් ගිණුමේ පවතින ශේෂය අන්තර්ග්‍රහණය කිරීම සඳහා NDB බැංකුව වෙත අයිතිය රඳවා ගනු ලැබේ.

(ආ) විදේශ විනිමය නියෝග හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක්, නියමයක්, විධානයක් හෝ නියෝගයක් උල්ලංඝනය වී ඇති බවට බැංකුව සෑහීමට පත්වන අවස්ථාවක දී, NDB බැංකුව විසින් ස්වකීය අවශ්‍යතාවය අනුව ගිණුම්හිමියා (ගිණුම්හිමියන්) වෙත නිවේදනය කිරීමෙන් තොරව ගිණුම වසා දමනු ලැබිය හැකි ය.

(ඇ) බැංකුව විසින් ස්වකීය අවශ්‍යතාවය පරිදි හෝ යම් අධිකරණයක අවශ්‍යතාවක් හෝ පරිපාලනමය අවශ්‍යතාවක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින්, ගිණුම්හිමියා වෙත පූර්ව නිවේදනයක් ලබාදීමෙන් තොරව හෝ බැංකුව විසින් ගිණුම්හිමියා වෙත ඉටුකළ යුතු යම් වගකීමක් උල්ලංඝනය වීම සඳහා යටත්වීමෙන් තොරව ගිණුම (ගිණුම්) සම්බන්ධ ගනුදෙනු වසා දැමීම තහනම් කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

(ඈ) විශේෂ අවස්ථානුගත කරුණු යටතේ අදාල නීති සහ නියෝගවලට අනුකූලව ක්‍රියාකිරීම හේතුවෙන් යම් ගෙවීමක් සිදුකිරීම හෝ නිශ්කාශනය කිරීම, ගිණුම්හිමියාගේ උපදෙස් සකස්කිරීම හෝ සේවා සඳහා ඉල්ලුම්කිරීම හෝ සේවා සියල්ල හෝ එහි යම් කොටසක් සැපයීම NDB බැංකුවේ පාර්ශවයෙන් ප්‍රමාදවීමට, අවහිරවීමට හෝ ප්‍රතික්ෂේපවීමට හේතුවිය හැකි ය. එම නීතිවලට හෝ නියෝගවලට අනුකූලව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් සිදුවූ ගිණුම්හිමියා හෝ තුන්වන පාර්ශවයක් විසින් විඳින ලද හෝ දරන ලද ඕනෑම ආකාරයකින් පැනනගින පාඩු සම්බන්ධයෙන් නීතිය මගින් අවසර දෙනතාක්දුරට NDB බැංකුව ගිණුම්හිමියා වෙත හෝ යම් තුන්වන පාර්ශවයක් වෙත වගකියනු නොලැබිය යුතු ය.

18. NDB බැංකුව වෙත ලබාදී ඇති සියලු තොරතුරු (ගිණුම් විවෘත කිරීමේ ඉල්ලුම්පත්‍රයේ හෝ අන්‍යාකාරයකින්) ගිණුම්හිමියාගේ දැනීමට අනුව සත්‍ය සහ නිවැරදි බවට ගිණුම්හිමියා සහතිකර සිටියි. හවුල්ව්‍යාපාරයේ/හවුල්කරුවන්ගේ සහ ඔවුන්ගේ ලිපිනයන්හි යම් වෙනසක් සිදුවීම ඇතුලු මෙම තොරතුරුවල යම් වෙනසක් සිදුවුවහොත් ගිණුම්හිමියා විසින් ඒ පිළිබඳව වහාම NDB බැංකුව වෙත නිවේදනය කළ යුතු වේ.

19. NDB සමග සිදුකරන සියලු මුදල් තැන්පතු NDB බැංකුවේ කවුන්ටර්වලදී ගෙවනු ලැබිය යුතු වේ.

20. චෙක්පත් තන්පතු යන්ත්‍ර මගින් හෝ බැංකුව විසින් සේවයේ යොදවා ඇති වෙනත් යම් යන්ත්‍රයක් මගින් නිකුත් කරනු ලබන තාවකාලික උපදෙස් පත්‍රිකාවල කුමක් සඳහන් වුව ද, එය නොසලකා හරිමින්, එම යන්ත්‍රවල තැන්පත් කරන ලද චෙක්පත් ගිණුම්හිමියාගේ ගිණුම (ගිණුම්) වෙත බැරවී ඇත්නම් මිස, කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ හෝ කිසිදු ආකාරයක හේතුවක් නිසා චෙක්පත් තැන්පතු යන්ත්‍රවල තැන්පත්කර ඇති බවට කියනු ලබන චෙක්පත් සම්බන්ධයෙන් වූ හිමිකම්පෑම් NDB බැංකුව විසින් විමසා බලනු නොලැබේ. ගිණුම්හිමියාගේ ගිණුම (ගිණුම්) වෙත තැන්පත් කරනු ලබන චෙක්පත් එක් රැස්කර ගැනීම සඳහා පමණක් භාරගනු ලබන අතර චෙක්පත් නිකුත් කරන ලද බැංකුව විසින් නිශ්කාශනය කරනු ලබන තෙක් චෙක්පත් ප්‍රතිශ්ඨා මුදල් ආපසු ලබාගැනීම සඳහා නොපවතිනු ඇත. පෙන්වාදීමේ කාර්ය සඳහා පමණක් මුදල් පවතින දිනය සඳහන් කරනු ලැබේ.

21. භාර ගිණුමක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, භාර සාධනපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට භාරයේ කාර්ය සඳහාම භාර ගිණුම දැඩිලෙස ප්‍රයෝජනයට ගනු ලබන බවට සහතිකවීම සම්බන්ධයෙන් භාරකරුවන් පරම වශයෙන් වගකිව යුතු මෙන්ම වගකිමෙන් බැඳී සිටිය යුතු අතර එම භාර ගිණුම විවෘත කර පවත්වාගෙන යෑම සඳහා අවසර ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස NDB බැංකුවට එරෙහිව සිදුවිය හැකි නඩුපැවරීම්, හිමිකම්පෑම්, ඉල්ලීම් හෝ පාඩුවලට එරෙහිව භාරකරුවන් විසින් NDB බැංකුව, එහි අධ්‍යක්ෂවරුන් සහ සේවා නියුක්තිකයන් හානි පූරණයකර නිදහස්ව තැබිය යුතු වේ.

22. විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළ නීති, උපකාරක නීති, විදේශ විනිමය නියෝග, වෙනත් නියෝග, ගැසට් නිවේදන සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාල එවැනි දේ පිළිබඳව දැනුවත්ව සිටින ලෙස/දැනුවත් වන ලෙස විදේශ ව්‍යවහාර ගිණුම්හිමියන් වෙත දැනුම් දී සිටින අතර ව්‍යවස්ථාපිත/ නියාමන නියාමයන් උල්ලංඝනයවීමේ අවදානම දුරුකිරීම සඳහා සියලු අවස්ථාවලදී විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්හිමියන් විසින් ඉහතකී උපකාරක නීතිවලට, විදේශ විනිමය නියෝගවලට වෙනත් නියෝගවලට ගැසට් නිවේදනවලට සහ එවැනි වෙනත් කරුණුවලට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

23. ගිණුම්හිමියකු සම්බන්ධයෙන්, බැංකුව සමග දරනු ලබන ගිණුම (ගිණුම්) සම්බන්ධයෙන් හෝ පහත සඳහන් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බැංකුව සමග පවතින ගිණුම්හිමියාගේ සම්බන්ධතාවයට අදාල තොරතුරු ඇතුලු (එයට සීමා නොවන්නා වූ) ගිණුමට (ගිණුම්වලට) අදාල තොරතුරුවල ඕනෑම කාර්යයක් සඳහා හෙලිදරව් කිරීම සඳහා බැංකුවට අයිතියක් ඇති බවට ගිණුම්හිමියා විසින් කියා සිටින අතර ඒ සඳහා මෙයින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ;

(අ) ගිණුම්හිමියාගෙන් විමසීමෙන් තොරව වෙනත් යම් බැංකුකරුවන් වෙත; ණය තොරතුරු කාර්යාංශය වෙත හෝ ගිණුමට (ගිණුම්වලට) අදාල යම් පාර්ශවයක් වෙත, හෝ නෛතික වශයෙන් බලයලත් තැනැත්තකු වෙත සැක දුරුකිරීමේ කාර්ය සඳහා එවැනි ප්‍රතිචාරයක් සඳහා බැංකු යොමුවක්ද ඇතුළත් වේ.

(ආ) නීතිය මගින් හෝ අධිකරණ නියෝගයක් මගින් එම හෙලිදරව්කිරීම සිදුකරන ලෙස බැංකුව වෙත නියම කරනුයේ හෝ බලය පවරනුයේ යම් තැනැත්තකු වෙතද එවැනි තැනැත්තකු;

(ඇ) බැංකුව වෙත රහස්‍යභාවය පිළිබඳ වගකීමක් දරනු ලබන යම් තැනැත්තකු වෙත.

**25. ෆැක්සිමිලි මගින්/විද්‍යුත් තැපැල මගින් ලබාදෙන බැංකු උපදෙස්**

(අ) බලයලත් අත්සන්කරුවන් විසින් NDB බැංකුව වෙත ලිඛිතව අන්‍යාකාරයකින් උපදෙස් ලබාදී ඇත්නම් මිස, (4 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද) ෆැක්සිමිලි යන්ත්‍රයක් හරහා හෝ නම්කල විද්‍යුත් ලිපිනයක් හරහා ප්‍රේෂණය කරනු ලබන (අන්‍යාකාරයකින් නිශ්චිතව පටහැනි ලෙස ප්‍රකාශකර ඇත්නම් මිස මෙම නියම හා කොන්දේසි සම්බන්ධයෙන් බලයලත් අත්සන්කරුවන් විසින් ලබාදීමට නියමිත හෝ ලබාදෙන උපදෙස් ඇතුලුව) ගිණුම්හිමියාගේ බැංකු උපදෙස් මත ක්‍රියාකිරීමට NDB බැංකුව වගකීමෙන් බැඳී නොසිටිය ද එසේ එම උපදෙස් මත ක්‍රියාකිරීමට NDB බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. NDB බැංකුව වෙත ලබාදී ඇති මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව එම විද්‍යුත් පණිවුඩය සමග ගිණුම්හිමියාගේ උපදෙස්වල පරිලෝකනය කර අත්සන් කරන ලද පිටපතක්ද අමුණා තිබිය යුතු වේ. මෙම කාර්ය සඳහා වන නම්කල විද්‍යුත් ලිපිනය, ව්‍යාපාර සඳහා හෝ ආස්ථිත්ව සඳහා වූ මැන්ඩේට්පත්‍රයේ NDB බැංකුව වෙත සපයා ඇති ගිණුම්හිමියාගේ (ගිණුම්හිමියන්ගේ) විද්‍යුත් ලිපිනය විය යුතු ය. මෙය ගිණුම්හිමියා (ගිණුම්හිමියන්) විසින් පත්කරනු ලබන ඇටෝර්නි බලකරුවන් සඳහා අදාල නොවිය යුතු ය.

(ආ) පහත දැක්වෙන කරුණුවල ප්‍රතිඵලයක් ලෙස හෝ එම කරුණුවලට ආශ්‍රිතව ඕනෑම ආකාරයකින් උපචිත වන සියලු සිවිල් නඩු, අපරාධ නඩු, නඩුකටයුතු, පිරිවැය, හිමිකම්පෑම්, ඉල්ලීම්, ගාස්තු, වියදම්, පාඩු සහ වගකීම් තුලින් හෝ ඒ හා සම්බන්ධයෙන් බැංකුව විසින් ඕනෑම ආකාරයකින් දරනු ලැබිය හැකි හිමිකම්පෑම්, පාඩු හෝ අලාභවලින් ගිණුහිමියා විසින් NDB බැංකුව නිදහස් කර හානිපූරණය කර NDB බැංකුව අගති විරහිතව තබනු ලැබිය යුතු වේ.

(i) යම් උපදෙසක් (උපදෙස්) වැරදිසහගත ලෙස උපචිත වී හෝ සම්ප්‍රේෂණය වී හෝ වංචාසහගත ලෙස වෙනස්කර, වැරදි ලෙස අවබෝධකරගෙන හෝ සන්නිවේදනයේ දී හෝ සම්ප්‍රේෂණයේ දී විකෘති වී තිබීම නොසලකා හරිමින්, එම නම් කල විද්‍යුත් ලිපිනය හරහා යවන ලද ලිඛිත ෆැක්සිමිලි උපදෙස (උපදෙස්) හෝ වෙනත් උපදෙස් ප්‍රකාරව NDB බැංකුව විසින් සද්භාවයෙන් ක්‍රියාකර තිබීම; සහ

(ii) යැවීමේ හෝ ලැබීමේ යන්ත්‍රයේ, අක්‍රීයවීමක්, දෝෂයක් හෝ සූදානම්ව නොතිබීමේ තත්ත්වයක් හේතුවෙන් යන ඕනෑම හේතුවක් නිසා ගිණුම්හිමියාගේ ලිඛිත, දුරකථන, ෆැක්සිමිලි හෝ විද්‍යුත් උපදෙස (උපදෙස්) සැබෑ ලෙස NDB බැංකුව වෙත සම්ප්‍රේෂණය කිරීමට හෝ NDB බැංකුව විසින් ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් ගිණුම්හිමියාගේ ලිඛිත, දුරකථන, ෆැක්සිමිලි හෝ විද්‍යුත් උපදෙස (උපදෙස්) ප්‍රකාරව ක්‍රියාකිරීමෙන් NDB බැංකුව වැලකී සිටීම්; හෝ

(iii) NDB බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලබන කාලසීමාව ඇතුලත NDB බංකුව වෙත ගිණුම්හිමියා විසින් ෆැක්සිමිලි උපදේශයේ (උපදෙස්වල) සියලු මුල්පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම.

(ඇ) ෆැක්සිමිලි හෝ ඊමේල් මගින් උපදෙස් ලබාදෙන හෝ උපදෙස් ලබාදෙන බවට සලකනු ලබන තැනැත්තාගේ අධිකාරී බලය හෝ අනන්‍යතාවය විමසීම සම්බන්ධයෙන් සහ (තත්කාලයේ පැවති අවස්ථානුගත තත්ත්වයන් නොසලකා හරිමින්) එම උපදෙස් ලැබෙන අවස්ථාවේදී ෆැක්සිමිලි මගින් හෝ ඊමේල් මගින් බැංකුව වෙත ලැබෙන උපදෙස්වල හෝ නියෝගවල සත්‍යභාවය හෝ අන්‍යාකාර කරුණක් තත්‍යාපනය කිරීම සම්බන්ධයන් NDB බැංකුව කිසිදු ආකාරයකින් වගකීමක් දරනු නොලැබේ. NDB බැංකුව විසින් ෆැක්සිමිලි සහ ඊමේල් නියමිත කාලයේදී සහ දිනයේදී ලබාගැනීමේ රීතිය ගිණුම්හිමියා විසින් පිළිගනු ලැබිය යුතු වේ.

(ඈ) ගිණුම්හිමියාගේ උපදෙස හෝ නියෝග හෝ ගිණුම්හිමියා විසින් අවසර ලබාදුන් උපදෙස් හෝ නියෝග ලෙස NDB බැංකුව විසින් සද්භාවයෙන් පිළිගෙන සිටින්නා වූද එහෙත් ගිණුම්හිමියා විසින් නිකුත් නොකල හෝ ගිණුම්හිමියා විසින් අවසර ලබා නොදුන් ෆැක්සිමිලි හෝ

විද්‍යුත් උපදෙස් හෝ නියෝග මත NDB බැංකුව විසින් ක්‍රියාකිරීම හේතුවෙන් ගිණුම්හිමියා විසින් දරනු ලැබිය හැකි පාඩු සම්බන්ධයෙන් NDB බැංකුව වගකීමෙන් බැඳී සිටිනු නොලැබිය යුතුය. එසේ වුව ද NDB බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි යම් ෆැක්සිමිලි උපදෙස් හෝ විද්‍යුත් උපදෙස් මත ක්‍රියාකිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(ඉ) ෆැක්සිමිලි හෝ විද්‍යුත් උපදෙස් හෝ නියෝග පිළිගැනීම සඳහා වූ NDB බැංකුවේ අධිකාරී බලය අඛණ්ඩව පවතින අධිකාරී බලයක් වන අතර එම අධිකාරී බලය අවසන් කරමින් ගිණුම්හිමියා විසින් ලබාදෙන ලිඛිත නිවේදනයක් NDB බැංකුව වෙත ලැබෙන තෙක් එම අධිකාරී බලය අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

(ඊ) ෆැක්සිමිලි සම්ප්‍රේෂණ සහ විද්‍යුත් පණිවුඩ යනු උපදෙස් සහ නියෝග ලබාදීමේ සුරක්ෂිත ක්‍රම නොවන බවත් මෙසේ උපදෙස් හා නියෝග ලබාදීමේදී පවතින අවදානම් පිළිබඳව ගිණුම්හිමියා දැනුවත්ව සිටින බවත් එම ෆැක්සිමිලි හෝ විද්‍යුත් පණිවුඩ උපදෙස් සහ නියෝග පිළිගෙන ඒ මත ක්‍රියාකරන ලෙස ගිණුම්හිමියා විසින් NDB බැංකුවෙන් ඉල්ලා සිටිනුයේ ගිණුම්හිමියාගේ පහසුව පිණිස වන බවත් එසේ ක්‍රියාකිරීමේ අවදානම පරම වශයෙන් ගිණුම්හිමියා විසින් භාරගන්නා බවත් ගිණුම්හිමියා විසින් පිළිගෙන සිටියි.

**26. ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ ගිණුම් බදු අනුකූලතා පනත (FATCA)**

(අ) තොරතුරු හෙළිදරව් කිරීමේ නියමයට අනුකූලව ක්‍රියාකරන ලෙස වූ නියමයක්/ වගකීමක් NDB බැංකුව වෙත පැවරී ඇති අවස්ථාවකදී, ගිණුම්හිමියාගෙන්/ එහි අයිතිකරුගෙන්/ හවුල්කරුවන්ගෙන් විමසීමෙන් පසුව හෝ එසේ විමසීමෙන් තොරව, ගිණුම්හිමියා/ අයිතිකරු/ හවුල්කරු විසින් විවෘත කරන ලද/පවත්වාගෙන යනු ලබන /සාදන ලද සහ/හෝ වසාදමන ලද ගිණුමට (ගිණුම්වලට) අදාළ සියලු තොරතුරු ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර ආදායම් සේවය වෙත (IRS) හෝ ඇමරිකා එක්සත් ජනපදයේ වෙනත් යම් නියාමන අධිකාරියක් වෙත හෝ වෙනත් යම් කලාපයක් වෙත වාර්තා කිරීම සඳහා NDB බැංකුව වෙත මෙයින් බලය පවරා සිටිනු ලැබේ.

(ආ) (සංශෝධිත) 1988 අක 30 දරන බැංකු පනතේ 77 වන වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම කැමැත්ත ප්‍රදානය කරනු ලැබේ.

(ඇ) ගිණුම්හිමියාගෙන් තවදුරටත් වූ කැමැත්ත ලබාගැනීමෙන් තොරව, FATCA විධිවිධාන යටතේ හෝ වෙනත් යම් කලාපයක්/කලාප විසින් පනවන ලද/හෝ පනවනු ලැබිය හැකි වෙනත් යම් නියෝගයක්/නියෝග යටතේ ගිණුමෙන් (ගිණුම්වලින්) මුදල් හරකිරීම මගින් අවශ්‍ය වේ නම් IRS වෙත හෝ වෙනත් යම් නියාමන අධිකාරියක් (අධිකාරීන්) වෙත ගෙවිය යුතු බදු සහ/හෝ පැනවීම් ප්‍රේෂණය කිරීම සඳහා NDB බංකුව වෙත තවදුරටත් බලය පවරා සිටිනු ලැබේ.

**27.** බැංකුව වෙත වාචිකව හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය හරහා හෝ නිල ප්‍රකාශනය හරහා හෝ මෙහි ලබාදී ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව බැංකුවේ සමීපතම ශාඛාව වෙත හෝ බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය වෙත හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිතව ඕනෑම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ අයිතිය ගිණුම්හිමියා සතු වේ. යම් පැමිණිල්ලක් විසඳා නොමැති අවස්ථාවකදී ගිණුම්හිමියා විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හරහා හෝ ශ්‍රී ලංකා මහබැංකුව හරහා ඒ සඳහා විසඳුමක් ඉල්ලා සිටිය හැකි වේ.

**28.** සැකකටයුතු ගනුදෙනු පිළිබඳව සහ උපරිම සීමාවට ඉහල ගනුදෙනු පිළිබඳව අදාළ අධිකාරීය වෙත වාර්තාකිරීමේ අයිතිය බැංකුව සතු වේ.

**29.** ව්‍යාපාරික බැංකු කාණ්ඩය සඳහා වූ යෝග්‍යතාවය මත පදනම්ව කාර්තුමය පදනමක් මත බැංකුව විසින් ගිණුම්හිමියාව ඉහළ ශ්‍රේණිගත කිරීම හෝ පහළ ශ්‍රේණිගත කිරීම සිදුකළ හැකි බවත් ලියාපදිංචි තැපැලෙන් එවනු ලබන ලිපියක් මගින් ඒ පිළිබඳව ගිණුම්හිමියා දැනුවත් කරනු ලැබිය යුතු බවටත් ගිණුම්හිමියා විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

**30.** ගිණුම්හිමියාගේ නම් කල ජංගම දුරකථන අංකය වෙත එවනු ලබන කෙටිපණිවුඩයක් (SMS) මගින්/ ගිණුම්හිමියාගේ නම්කළ විද්‍යුත් ලිපිනය වෙත එවනු ලබන විද්‍යුත් පණිවුඩයක් මගින් ගිණුම්හිමියා වෙත පූර්ව නිවේදනයක් ලබාදීම මගින් අවම සාමාන්‍ය බැරකම් ශේෂය වෙනස්කිරීම, සංශෝධනය කිරීම, වැඩිකිරීම හෝ අඩුකිරීම සඳහා බැංකුවට හිමිකමක් පවතින බවට ගිණුම්හිමියා විසින් මෙයින් එකඟව සිටියි.

**31.** හවුල්කරුවකු මියයෑමේදී හෝ බංකොලොත්භාවයට පත්වීමේ දී, ප්‍රකාශිත හවුල්ව්‍යාපාර ගිවිසුමකට යටත්ව හවුල් ව්‍යාපාරය විසුරුවා හරිනු ලැබේ. හවුල්කරුවකු මියයෑම, හෝ බංකොලොත්භාවයට පත්වීම හෝ විශ්‍රාමයෑම හේතුවෙන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමේ දී, බැංකුව විසින් වහාම ගිණුම නවතා දමා අලුත් ගිණුමක් විවෘත කරන ලෙස සෙසු අඛණ්ඩව ක්‍රියාකරන හවුල්කරුවන්ගෙන් ඉල්ලා සිටිය යුතුවේ.

**32.** බැංකුවේ පරම අභිමතය පරිදි ගිණුම්හිමියා වෙත නිවේදනය කිරීමෙන් පසුව මෙම නියම හා කොන්දේසි සංශෝධනය කිරීමට, ඒ සඳහා යමක් එකතුකිරීම හෝ වෙනස්කිරීමට බැංකුව ඕනෑම අවස්ථාවකදී හිමිකමක් පවතින බවත් එම සංශෝධන, එකතු කිරීම් හෝ වෙනස්කිරීම් මගින් ගිණුම්හිමියා බැඳී සිටිය යුතු බවත් ගිණුම්හිමියා විසින් මෙයින් පිළිගෙන සිටියි. නියම සහ කොන්දේසිවල යාවත්කාලීන කරන ලද අනුවාදය (අනුවාද) බැංකුවේ ආයතනික වෙබ් අඩවියේ පවතින අතර එම අනුවාදය (අනුවාද) ගිණුම්හිමියාගේ නම් කළ ජංගම දුරකථන අංකය වෙත කෙටිපණිවුඩයක් (SMS) මගින්/ ගිණුම්හිමියාගේ නම්කළ විද්‍යුත් ලිපිනය වෙත විද්‍යුත් පණිවුඩයක් එවීම මගින් ගිණුම්හිමියා වෙත නිවේදනය නිවේදනය කරනු ලැබිය යුතු වේ. (අදාළ පරිදි) යම් පැහැදිලි කරගැනීමක් සඳහා ගිණුම්හිමියා විසින් අදාළ සම්බන්ධතා කළමනාකරු හෝ ණය නිලධරයා හා සම්බන්ධ විය හැකි ය.